# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 817/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 15/05/2024 පැය 1430

# මාධ්‍ය නිවේදනය

## අධිකරණ නියෝගයක් දැනුම් දීම.

2024.05.15 වන අද දින දේශපාලන පක්ෂයකට අනුබද්ධ වෘත්තීය සමිතිවල ක්‍රියාකාරීන් ඇතුළු පිරිසක් විසින් උද්ඝෝෂණයක් හා විරෝධතා පාගමනක් පැවැත්වීමට සූදානම් කර ඇති බවට මරදාන පොලිස් ස්ථානාධිපතිවරයාට ලත් තොරතුරක් මත එම උද්ඝෝෂණ සැලසුම්කරුවන් විසින් ටෙක්නිකල් හන්දිය, ඔරාබිපාෂා මාවත, ඩීන්ස් පාර, ඉබ්බන්වල හන්දිය, ඩාර්ලි පාර, පංචිකාවත්ත පාර, ඩී.ආර් විජේවර්ධන මාවත, ගාමිණී වටරවුම ඔස්සේ නෙළුම් කුළුණ ප්‍රධාන මාර්ග වල ගමන් ගන්නා ගිලන් රථ හා ගිනි නිවන හමුදා රථ, අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටින සිසුන්, ගමන් ගන්නා වාහන වල හා මහජනතාවට, පදික වේදිකාවේ ගමන් කරන අයවළුන්ට පීඩාවක්, අවහිරයක්, බාධාවක්, කරදරයක් නොකරන ලෙසට අපරාධ නඩු විධාන සංග්‍රහයේ පවතින ප්‍රතිපාදන ප්‍රකාරව පා ගමන් කරුවන්ට අඥාවක් නිකුත් කරන ලෙස මාලිගාකන්ද ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඉල්ලීමක් කර ඇත.

ඒ අනුව, ගරු අධිකරණය මඟින් ඉදිරිපත් කර ඇති කරුණු සලකා බලා පහත සඳහන් වග උත්තරකරුවන් වන

1. කේ.ඩී ලාල්කාන්ත, ජනතා විමුක්ති පෙරමුණේ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති
2. මහින්ද ජයසිංහ, ජනතා විමුක්ති පෙරමුණේ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ ලේකම්
3. වසන්ත සූරියආරච්චි, ජනතා විමුක්ති පෙරමුණේ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ නියෝජ්‍ය ලේකම්
4. රංජන් ජයලාල්, ලංකා විදුලි සේවක සංගමයේ ප්‍රධාන ලේකම්
5. නිරෝෂන් ගොරකානගේ, සමස්ත ලංකා වරාය පොදු සේවක සංගමයේ ප්‍රධාන ලේකම්
6. එරංග ගුණසේකර, සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක ඇතුළු විරෝධතාකරුවන් හා ඉහත වගඋත්තරකරුවන් සමඟ 2024.05.15 වන දින සහභාගී වන තවත් අයට

ටෙක්නිකල් හන්දියේ සිට කැළෑ පොල දක්වාද, ටෙක්නිකල් හන්දිය, ඔරාබිපාසා මාවත, ඩීන්ස් පාර, ඉබ්බන්වල හන්දිය, ඩාර්ලි පාර, ගාමිණී වටරවුම ඔස්සේ නෙළුම් කුළුණ මාර්ගය දක්වා වූ මාර්ග සහ ඒ අවට පදික වේදිකා භාවිතා කල නොහැකි ලෙස අහුරමින් සිදු කරන පෙලපාලි තහනම් කරමින් අධිකරණ ආඥාවක් නිකුත් කර ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**